# ක්ෂුද්‍ර මූල්‍ය සමාගමක රැකියා පුරප්පාඩු

දිවයිනේ මානව යහපැවැත්ම, සංවර්ධනය සහ ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කරන දිවයිනේ පුරෝගාමී ක්ෂුද්‍ර මූල්‍ය රාජ්‍ය නොවන සංවිධානායක් වන අප සමාගමේ **ණය ලබාදීමේ සහ ණය අයකර ගැනීමේ නිලධාරි තනතුරු** සඳහා ඉතා කාර්යක්ෂමව කටයුතු කල හැකි ක්‍රියාශීලී පෞරුෂත්වයකින් හෙබි අය සඳහා කොළඹ, කොට්ටාව, මොරටුව, ගම්පහ සහ ගාල්ල යන ප්‍රදේශයන්හි රැකියා අවස්ථාවන් ඇත.

**වගකීම්**

- ණය නිකුත් කිරීමේ සහ / අයකරගැනීමේ ආයතනික ඉලක්ක වෙත ළඟා වීම
- මනා ඇගයීමකින් පසු වගකීම් සහිත ණය නිකුත් කිරීම සහ 100% ණය අයකරගැනීම
- ගණුදෙණුකරුවන් සමග මෙන්ම පාර්ශවකරුවන් සමග නිරන්තර යහපත් සබඳතාවයක් පවත්වා ගැනීම
- කල් ඉකුත් වූ ණය දක්ෂ ලෙස, ඒත්තු ගන්වමින් සහ වෘත්තීයමය ආකාරයෙන් අයකර ගැනීම
- අඛණ්ඩ පසු විපරම් මතක් කිරීමේ ඇමතුම් සහ ගනුදෙනුකරුවන් හමුවීම
- ගනුදෙනුකරුවන් හමුවී කල් ඉකුත් වූ ණය නැවත සැලසුම් කර නව ණය ගිවිසුම පසුවිපරම් කිරීම
- පසු විපරම් ක්‍රියා සහ ප්‍රතිසාධන කටයුතු පිළිබඳ අඛණ්ඩ වාර්තා පවත්වාගෙන යාම
- මාසික ප්‍රතිසාධන සහ අය කරගැනීමේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම
- සිහි කැඳවීමේ නිවේදන සහ ලිපි නිකුත් කිරීම
- නීති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධවී ප්‍රතිසාධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය සහාය ලබා ගැනීම
- නැවත කාලසටහන්ගත කල ගෙවීම් සැලසුම් පිළිබඳව නිතිපතා පසු විපරම් කිරීම

**මූලික අවශ්‍යතා**

- අ.පො.ස. (උ.පෙළ)සමත් වීම සහ පරිගණක සාක්ෂරතාව
- සිංහල හා ඉංග්‍රීසි භාෂා වලින් ලිවීමේ මනා හැකියාව
- කුඩා කණ්ඩායම් සහ ලියාපදිංචි සමිති සමඟ වැඩ කිරීමේ හැකියාව
- ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ අවුරුදු පහක සේවා පළපුරුද්ද
- සේවාලාභීන් හමුවීමට සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රැකියා අවශ්‍යතාවයක් ලෙස පුළුල් ලෙස සංචාරය කිරීමට ඇති කැමැත්ත සහ වලංගු යතුරුපැදි ධාවන බලපත්‍රයක් තිබීම
- අවම අධීක්ෂණයකින් කාර්යයක් ඉටු කිරීමේ හැකියාව
- වයස අවුරුදු 35 - 45 අතර

***දිරි දීමනා මත පදනම් වූ ඉතා ආකර්ශනීය වැටුප්***

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇත්නම් දැන්ම අයදුම් කරන්න.

**ප්‍රධාන මෙහෙයුම් නිලධාරී**
**එක්ලොෆ් ලංකා (ගැරන්ටි) ලිමිටඩ්.**
**නො. 138 1/1, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.**
**විද්‍යුත් තැපැල - eclof@eureka.lk**